# Summaries in Sinhala

**අන්තර්ජාතික ආධාර සැපයීමෙහි නියුතු කාර්ය මංඩල මුහුණ දෙන ආතතින් හා ඔවුන්ට අවශ්‍යය සහය ලබා දීමේ ක්‍රමෝපායයන්**

ඉතාමත් අභියෝගාත්මක වාතාවරණයන් තුල මානුෂිය ආධාර සැපයීමේ කටයුතු වල නිරත වන නිලධාරීන් මුහුණදෙන විවිධාකාර වූ ආතතතීන් පිළිබඳව හෙළිදරව් කිරීම සහ ඒවා සමනය කරගැනීමට යොදාගත හැකි ක්‍රමවේදාත්මක ආකෘතීන් පිලිබඳව සමාලෝචනයක් මෙම ලිපියෙහි ඇතුලත්වේ. රැකියා ස්ථානයේ ඇතිවන ආතතතීන් පිළිබඳව මහා පරිමාන අන්තර් ජාතික සංවිධානයක් ඇසුරින් 2009 වසරේ දී කරන ලද පුලුල් පර්යේෂණයක ප්‍රථිපල මෙහි සාරාංශගත කර ඉදිරිපත් කෙරෙන අතර, 2003 වසරේ දී මෙම ආයතනය තුලම කරන ලද මිට සමාන වූ අධ්‍යයනයක ප්‍රතිපල සමග තුලනාත්මක සංසන්දනයක් ද අඩංගු වේ.

මානුෂිය ආධාර සැපයීමේ ක්‍රියාවලියේදී ආතතීන්ට තුඩු දෙන ප්‍රධාන කරුණු ලෙස ස්වයං ඇගයුම් ප්‍රශ්නාවලියකට ප්‍රතිචාර දැක්වූවන් විසින් හඳුනාගත් කරුණු මෙහි අතුලත්ය. ඊට අමතරව හදිසි මානුෂිය අවස්ථා තත්ත්වයන් තුල ක්‍රියා කරන කාර්යය මණ්ඩල හා ඊට සාපේක්ෂව වැඩි ආරක්ෂාවක් සහිත ප්‍රධාන කාර්යාලයේ කාර්යය මණ්ඩලත්, පිරිමි සහ ගැහැණු වශයෙනුත්, ජාතික හා විජාතික වශයෙනුත් උප කණ්ඩායම් වලට බෙදා එම විශ්ලේෂණයන් මෙහි දක්වා ඇත. අවසාන වශයෙන්, කාර්යය මංඩලයේ සහයෝගීතාව ලබාගැනීමේ ක්‍රමෝපායයන් රාශියක කාර්යක්ෂමතාව පිළිබඳවත්, සම-මට්ටමේ සගයන් විසින් සහය සැපයීම පිළිබඳ වැඩසටහනක සමාලෝචනයක් ද මෙහි ඇතුලත්වේ.

**මූලික යෙදුම්:** අන්තර්ජාතික මානුෂිය ආධාර සපයුම් සේවා, ආතතිය, දරා ගැනීමේ ක්‍රමවේදයන්, කාර්යය මණ්ඩල සහය, කාර්යය මණ්ඩලයේ යහ පැවැත්ම, සම-මට්ටමේ සගයන් විසින් සහය සැපයීම පිළිබඳ වැඩසටහන්

**මනෝ සමාජීය මැදිහත්වීම් වලදී චලනයන්, තරඟ හා ක්‍රිඩා යොදාගැනීම: සංවර්ධනය සඳහා සහයෝගය ලබාගැනීමේදී මෙමගින් ලබාගත හැකි ප්‍රයෝජන සහ එහි සීමාවන් පිළිබඳව විවේචනාත්මක අදහස් දැක්වීමක්**

මෙම ලිපිය මගින් චලන ක්‍රියාකාරකම්, තරඟ, හා ක්‍රීඩා, පශ්චාත් ගැටුම් පුනරුත්ථාපනය සහ ප්‍රචණ්ඩ, විනාශකාරී සහ ගැටුම්කාරී තත්ත්වයන් සහිත සංධර්භයක සංවර්ධන කටයුතු සඳහා සහයෝගය වර්ධනය කර ගැනීම සඳහා උපයෝගී කරගත හැකි අන්දම විවේචනාත්මකව සාකච්ඡාවට භාජනය කර ඇත. ඇත්ත වශයෙන්ම අපට මෙම ක්‍රීඩා, චලනයන් හා තරඟ තුලින් බලපෑමක් ඇතිකර ගැනීමට අවශ්‍යනම් මේවා මෙවලම් ලෙසට යොදාගැනීමේ දී සහභාගි වන්නන්ගේ දේශිය සංධර්භය, රුචිකත්වයන්, අවශ්‍යතා, නායකත්වය සහ නිශ්චිත අරමුණු සඳහාවූ ශක්තිමත් ස්ථාවර ක්‍රමෝපායන් පිළිබඳව අවධානය යොමුකළ යුතුය. මනෝ සමාජීය මැදිහත්වීම් වලදී භාවිතා කරන අනෙකුත් ක්‍රියාකාරකම්, අධ්‍යාපනික හෝ භෞතවේදමය මැදිහත් වීම් සමග ක්‍රීඩාවන් යොදාගත් විට ඒවා වඩාත් ප්‍රතිඵලදායක වේ. මෙම ලිපියේ සාකච්ඡා කෙරන ඵලදායී පර්යේෂණ හා ඇගයීම් ව්‍යාපෘති කිහිපයක් හැරුණු කොට, මෙහිදී යොදාගත් ක්‍රමෝපායන් හි බලපෑම් පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් තවමත් අප සතු නොවේ.

චලනයන්, තරඟ, හා ක්‍රීඩා මනෝ සමාජීය මැදිහත්වීම් සඳහා උපයෝගී කරගනිමින් සංවර්ධනය සඳහා සහයෝගය ලබා ගැනීමේ ව්‍යාපෘතීන් සඳහා කාර්යක්ෂමව අදාළ කරගත හැකි ප්‍රධාන කරුණු සහ මූලික දෘෂ්ඨීන් සමහරක් ඉදිරිපත් කරමින් අපි මෙම ලිපිය නිමාකරන්නෙමු. එසේම අපි සහභාගිවන්නන් එකිනෙකා අතර සහ ඔවුන් සමග ගොඩනගා ගන්නා සම්බන්ධතාවයන් සහ මැදිහත්වීමේදී සහභාගිත්ව ප්‍රවේශයක් ගන්නා ක්‍රියාකාරීත්වය හා ගතිකත්වය සමග ඇති සම්බන්ධතාවයෙහි වැදගත් බවද මෙහි ලා විශේෂයෙන් අවධාරණය කරමු.



Copyright © War Trauma Foundation. Unauthorized reproduction of this article is prohibited.

**මූලික යෙදුම්:** චලනයන්, තරඟ, ක්‍රීඩා, මනෝසමාජීය මැදිහත්වීම්, ගැටුම්, ප්‍රචණ්ඩත්වය

---

**අධ්‍යාත්මික හා මානසික සෞඛ්‍යය මානුෂීය සේවාසැපයීමේ පරිසරයක් තුල: හයිටියේ සිදුවූ භූමිකම්පාවේදී වර්ල්ඩ්ෂන් ආයතනය පයසුකම් ලබාදීමේදී ලත් අත්දැකීම් ඇසුරිනි**

අන්තර ජාතික රාජ්‍ය නොවන සංවිධාන සඳහා වැදගත් පණිවිඩයක් හයිටි දේශයේ හටගත් භූමිකම්පාව සම්බන්ධයෙන් වර්ල්ඩ් විෂන් සංවිධානය මගින් සිදු කරන ලද මැදිහත්වීම් තුලින් අණාවරනය විය. එනම්, මෙම ව්‍යසනයෙන් පීඩාවට පත්වූ පුද්ගලයිනගේ මානසික සෞඛ්‍යය සහ මනෝ සමාජීය අවශ්‍යතා හා බැඳුනු අධ්‍යාත්මික අවශ්‍යතා  සහ ද්‍රව්‍යමය ආධාර සැපයීම හා මැදිහත්වීම් අතර සැලකියයුතු, කැපීපෙනෙන හිඩැසක් පවතින බවය. මානසික සහ සෞඛ්‍ය සුභ සාධනයේදී අධ්‍යාත්මික භාවිතයන් ඉතා ප්‍රයෝජනවත් වන බවට විද්‍යාත්මක සාධක මගින් තහවුරු වෙමින් පැවතියද මනෝවිද්‍යාත්මක හා අධ්‍යාත්මික  ප්‍රවේශයන් පිළිබඳව උපදෙස් සහ එකඟතාවන් ඇත්තේ ඉතා සුලු වශයෙනි. මෙම තත්ත්වය විශේෂයෙන්ම හයිටි දේශයේ හදිසි ආධාර සැපයීමේදී වැදගත් වන්නේ ඔවුන්ගේ සංස්කෘතියේ ආගමික භාවිතයන් සහ විශ්වාසයන් තදින් මුල්බැසගෙන ඇති බැවිනි. මෙය ප්‍රායෝගික සහ ආචාරධර්මාත්මක වශයෙන් ගැටලුකාරී තත්ත්වයන්ට මගපෑදිය හැකිය. දේවස්ථාන, පූජක පක්ෂය සහ ජනතාව ගේ අධ්‍යාත්මික භාවයන් යනු විශේෂයෙන්ම මානසික සෞඛ්‍යය සහ මනෝ-සමාජීය ක්ෂේත්‍රයන්හි මානුෂිය සේවා සැපයීමේදී ගවේෂණයට ලක්කළ යුතු වැදගත් අංශයකි.

**මූලික යෙදුම්:** අධ්‍යාත්මික බව, ආගමික ස්වභාවය, මනෝ-ආධ්‍යාත්මික, විශ්වාසය, හයිටි

**පලස්තීන ළමුන් සහ වැඩිහිටියන් සඳහා මනෝවිද්‍යාත්මක සහය: හැසිරීම් සහ හැඟීම් පිළිබඳ සංකූලතා නිසා MSF වැඩ සටහනට වෙත යොමු කරන ලද පළස්තීනයේ අල්ලාගත් ප්‍රදේශයන්හි වෙසෙන  පිරිසක් ඇසුරෙන් කරන ලද දත්ත විශ්ලේෂණයකි**

අල් අක්සා ඉන්ටිෆාඩා (Al Aqsa Intifada) බිහිවූ අවධියේ සිටම පලස්තීනයේ අල්ලාගත් ප්‍රදේශ වල සිටින ළමුන් සහ වැඩිහිටියන් අතිශය ආතතියෙන් යුත් සිදුවීම් වලට දිනපතාම පාහේ ගොදුරු විය. සමහර පුද්ගලයින් ට මෙම නිසා තදබල හා දිගුකාලීනව පවත්නාවූ මානසික ව්‍යාධින් වැළැදිනි. MSF රාජ්‍ය නොවන සංවිධානය මේ අයට වෛද්‍ය සහ මනෝවිද්‍යාත්මක සහය සපයයි. මේ සඳහා ඔවුහූ පලස්තීන සංස්කෘතිය හා ගැටුම් සංධර්භය කෙරෙහි අවධානය යොමුකරගත් මනෝගතිකත්ව-මනෝචිකිත්සක ක්‍රමයක් යොදාගනිති. මෙම ලිපියේ 2000 සහ 2006 වසර ඇතුලත කාලයේ මනෝචිකිත්සකයන් වෙතින් ප්‍රතිකාර ලැබූ ගාසා තීරයේ සහ බටහිර ඉවුරේ වෙසෙන ළමුන් සහ වැඩිහිටියන් 1773ක ගේ තොරතුරු ඉදිරිපත් කර ඇත. මෙම ප්‍රතිකාර ලබා ගත් අයගෙන් අඩක්ම අවුරුදු 4ත් 14ත් අතර වයසේ පසුවන ළමුන්ය. මෙම මනෝචිකිත්සක ප්‍රතිකාරය හමුවීම් හයකින් පමණ සමන්විත විය. ප්‍රතිකාර ලබාදීමෙන් අනතුරුව රෝගීන්ගෙන් 80ක් පමණ සතුටුදායක තත්ත්වයට පත්වූහ. මෙහි කතුවරුන් ප්‍රකාශ කරන්නේ කෙටිකාලීන මනෝගතිකත්ව-මනෝචිකිත්සාවක් තුලින් ඉතා දුෂ්කර තත්ත්වයන්හිදී (යුධමය තත්ත්වය) සහ අරාබි සංස්කෘතිය තුලදී පවා පලස්තීනුවන් කෙරෙහි  ධනාත්මක ප්‍රතිඵල ඇති කිරීමට සමත්වූ බවය.  ඔවුන් පවසන්නේ මේ ආකරයේ පුද්ගලයන් ඉලක්ක කරගත් මනෝචිකිත්සක සහය සැපයීම් ප්‍රජාමටමේ මනෝ සමාජීය ප්‍රවේශයන්හිදී පලදායී ලෙස යොදාගත හැකි බවය.

**මූලික යෙදුම්:** මනෝගතිකත්ව-මනෝචිකිත්සාව, අල්ලාගත් පලස්තීන ප්‍රදේශ, තනි පුද්ගලයින් වෙත සැපයෙන මනෝවිද්‍යාත්මක සහය, ප්‍රතිකාර තුලින් ලද ප්‍රථිඵල


Copyright © War Trauma Foundation. Unauthorized reproduction of this article is prohibited.

අපි ගැබොවුලාඩ් ඇතුලු පිරිස (Gaboulaud et al.) විසින් ඉදිරිපත් කරන ලද ලිපිය පිළිබඳ සාකච්ඡා කිරීමට පළපුරුදු විශේෂඥ කණ්ඩායම් දෙකකට ආරාධනා කළෙමු. යෝක් රබියා වියෙට් ගුරේන්-ගිල්හිම් සහ රිටා ගිආකාමන් (Yoke Rabia, Viet Nguyen-Gillham, Rita Giacaman) ගේ අදහස වන්නේ පුද්ගලකේන්ද්‍රීයවූ ප්‍රවේශයක් මගින් සමාජය තුල දුක්ඛදායක තත්ත්වයන් ඇතිවීමට සහ මනෝව්‍යාධිමය ලක්ෂණ ඇතිවීමට හේතු විය හැකි බවත්, මෙය සුවකළ හැක්කේ පුද්ගලයා ඉලක්ක කරගත් ප්‍රතිකාර ක්‍රමවේදයක් තුලින් පමණක්ය යනුවෙන් අදහස් දක්වමින් මෙම ක්‍රමය පිළිබඳව බිය පළකරති.

මොවුන් යෝජනා කරන්නේ ප්‍රජාමට්ටමේවූ මනෝ සමාජීය ප්‍රවේශයකි. සුසාන් ප්‍රොසර් සහ අහමෙඩ් බවානේ (Susan Prosser, Ahmad Bawaneh) ඔවුන්ගේ අදහස් දැක්වීමේදී මනෝසමාජීය මනෝචිකිත්සාවන් පලස්තීන සංධර්භයට සුදුසු වන ලෙස යොදන්නේ කෙසේද යන්න පිළිබඳව ප්‍රශ්න කරන අතර විවිධත්වයෙන් යුත් සංස්කෘතීන්හි මනෝචිකිත්සක ක්‍රියාවන්හිදී භාෂාපරිවර්තකයින් යොදාගැනීමේ වැදගත්කම පිළිබඳ දැඩිව අවධාරණය කරයි.

---

**සමාජීය යහපැවැත්ම උදෙසා කෙරෙන මූලික හා ඉලක්කගත මනෝ සමාජීය මැදිහත්වීම් ක්‍රම පිළිබඳ සන්සන්ධනයක්ඃ මියන්මාරයේ/බුරුමයේ නාර්ගීස් සුලි-කුණාටුවෙන් පසුව කෙරුණු මැදිහත්වීම් ඇසුරින් උකහාගත් පාඩම්.**

මියන්මාරය/බුරුමය තුල මනෝ සමාජීය මැදිහත්වීම් යනු නව්‍ය සංකල්පයකි. මියන්මාරයට බල පෑ නාර්ගීස් සුලි කුණාටුවෙන් අනතුරුව කෙරුණු ඇගයීම් මගින් හෙලිදරව් වූයේ දේශීය ප්‍රජාව තුල මතුව ඇති මනෝ සමාජීය ගැටලු අරබයා කටයුතු කිරීමේ පැහැදිලි අවශ්‍යතාවයකි. පවත්නා සමාජ-දේශපාලනික බාධක මධ්‍යයේ රාජ්‍ය නොවන සංවිධාන විවිධාකාරයෙන් මෙම ගැටලු ආමන්ත්‍රණය කිරීමට උත්සහ දැරූහ. මෙම ක්ෂේත්‍ර වාර්තාව මගින් මනෝ සමාජීය මැදිහත්වීම් ආකෘති දෙකක් පැහැදිලි කොට ඒවා විශ්ලේෂණය කර ඇත. මින් එක් ව්‍යාපෘතියක් සම්පූර්ණයෙන්ම ප්‍රජාව හා කණ්ඩායම් ඉලක්කකොට ගත් ක්‍රමවේදයක් වන අතර, අනෙක් ව්‍යාපෘතිය විවිධ සමාජ තල ඉලක්කකර ගත් ක්‍රමවේදයක් තුල පුද්ගලයින් හා කණ්ඩායම් ඉලක්කකර ගෙන ඇත. මෙම මනෝ සමාජීය ව්‍යපෘති මෙතකින් නිමාවක් නොදකින අතර බිම් මට්ටමේ සිටින අනෙක් ක්‍රියාකාරීන් සමග සම්භන්ධීකරණය කිරීම හා ඉදිරි සංවර්ධන ව්‍යාපෘති සදහා පදනමක් සැකසීමත් මෙමගින් කෙරෙණු ඇත.

**මූලික යෙදුම්ඃ** ප්‍රජා මූලික මනෝ-සමාජීය සේවාවන්, අන්තර්ගතකෙරුණු හා ඉලක්කගත එළඹුම්, බුරුමය/මියන්මාරය

---

**හයිටි භූමිකම්පාවට ලැබුණු මනෝ සමාජීය ප්‍රතිචාරඃ IOM ආයතනයේ අත්දැකීම්.**

මෙම ක්ෂේත්‍ර වාර්තාව 2010 ජනවාරි මස සිදුවූ හයිටි භූමිකම්පාවට IOM ආයතනය දැක්වූ මනෝ සමාජීය ප්‍රතිචාරය කෙටියෙන් විස්තර කිරීමට සහ ඊට පාදක වූ ප්‍රතිපත්තීන් කිහිපයක් සනාත කිරීමටත් උත්සහ දරයි. ක්‍රියාකාරකම් අතර අන්තර් සම්භන්ධීකරණයත්, ජාතික මට්ටමේ හා ආයතන අතර සම්භන්ධීකරණයත්, ඍජු මැදිහත්වීම් හා හැකියාවන් වර්ධනය කිරීමත්, හයිටි සංස්කෘතියේ විශේෂ ලක්ෂණ හා සමස්ත මානුෂීය මැදිහත් වීමේ ස්වභාවයටත් නිසි තැන ලබා දෙමින් මෙම කරුණු මෙහි සවිස්තරාත්මකව දක්වා ඇත.

**මූලික යෙදුම්ඃ** භූමිකම්පාව, හයිටි, IASC උපසේමාලාව, IOM

---

**රැකවරණය සපයන්නන් වෙත රැකවරණය සැළසීමඃ මූල ලේඛණයක (කෙටුම්පතක) අඩංගු උපදෙස් පරිදි ක්‍රියා කිරීම හෝ අවස්ථාවට ගැලපෙන පරිදි සැකසූ වැඩසටහන් සැකසීම**

ඇතැම් බටහිර රටවල රැකවරණය සපයන්නන් වෙත අවශ්‍ය සහය සැළසීම


Copyright © War Trauma Foundation. Unauthorized reproduction of this article is prohibited.

*Intervention 2010, Volume 8, Number 2, Page 187 - 190*

සඳහා වන කෙටුම්පත් ඇතැම් රාජ්‍ය නොවන සංවිධාන විසින් සකසා ඇත. ආසියානු රටක මනෝ සමාජීය සේවකයින් තිදෙනෙකු වන මෙහි කතුවරුන් විසින් අන් කිසිදු මූල ලේඛණයක සඳහන් උපදෙස්වලට වඩා දේශීය සමාජ පරිසරයට සංවේදී ක්‍රමවේදයක් එළිදක්වා ඇත. මෙය දෙදිනක් තුල දේශීය සේවක කණ්ඩායම් දෙකකට අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධානයක් විසින් පැවැත්වූ ආතති කලමනණාකරණය පිළිබඳ වැඩමුළුවක් ඇසුරින් සිදු කරඇත. වැඩමුළු අවසානයේ ඊට සහභාගි වූවන්ගේ හැසිරීමෙහි පැහැදිළි වෙනසක් දක්නට ලැබුණිඃ ඔවුන් ආතතිය අඩුවී මහත් සැහැල්ලු බවකින් සිටි අතර ඔවුන්ගේ අලස බව දුරු වී අනාගතය අලුතින් ගොඩ නැගීමට අවශ්‍යය ආත්ම විශ්වාසය ගොඩනැගී තිබුණි. ඔවුහූ එම සම්න්ත්‍රණයෙන් බලගැන්වී සිටියහ. තෙමසකින් කළ පසු විපරමකින් මෙම ප්‍රතිඵලවල තිරසාර බව ප්‍රත්‍යක්ෂ විය.

**මූලික යෙදුම්ඃ** ආතතිය, ව්‍යසනය, ආතති කළමනාකරනය, කාර්යය මණ්ඩල සඳහා රැකවරණය, සිතට කාවැදුනු අසරණභාවය

## ග්‍රන්ථ විචාරය

සායනික මානව විද්‍යාඥ (Medical Anthropologist) ග්‍රේස් අකෙලෝ (Grace Akello) විසින් කෝට් ඩි අයිවරි (Cote d'Ivoire) හි ළමා සොල්දාදුවෙකුගේ ජීවිත අත්දැකීම් ඇසුරින් මෑතකදී එළිදැක්වුණු ප්‍රකාෂණයක් තමන් විසින් උගන්ඩාවේදී පැහැර ගැනීමට ලක් වූ දරුවන් හා කළ පර්යේෂණවලින් ලබා ගත් දැණුම සමග ඇති සමානකම් හා අසමානකම් පිළිබඳ විචාරාත්මක විමර්ෂණයක් ඉදිරිපත් කරයි.


Copyright © War Trauma Foundation. Unauthorized reproduction of this article is prohibited.